රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:- 1/2003

මගේ අංකය :ආ/1-1/3/7/2
රාජ්‍ය පරිපාලන, කළමණාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2003.01.03

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම**

විශ්‍රාම ලැබූ රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී පහත සඳහන් විධිවිධානයන් අදාල විය යුතු යයි රජය තීරණය කර ඇත.

(1) රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු සේවා කඩවීමක් සහිතව හෝ රහිතව කලින් දැරූ තනතුරේම නැවත සේවයේ යොදවනු ලබන විටෙක,ඔහු රාජ්‍ය සේවයේ අවසන් වරට ලැබූ වැටුප ගෙවීම

(II) විශ්‍රාම ලැබූ අවස්ථාවේදී හිමිකම් තිබූ වැටුප් පරිමාණයට වඩා ඉහළ වැටුප් පරිමාණයක් සහිත වෙනත් තනතුරක නැවත සේවයේ යොදවනු ලබන විටෙක, අවසන් වරට ලැබූ වැටුප හෝ ඔහු නැවත සේවයේ යොදවනු ලබන තනතුරේ ආරම්භක වැටුප හෝ යන දෙකින් ඉහළ වැටුප ගෙවීම

(III) විශ්‍රාම ලැබූ අවස්ථාවේදී හිමිකම් තිබූ වැටුප් පරිමාණයට වඩා පහළ වැටුප් පරිමාණයක් ඇති වෙනත් තනතුරක නැවත සේවයේ යොදවනු ලබන විටෙක, ඔහු අවසන් වරට ලැබූ වැටුප හෝ නව තනතුරට අනුයුක්ත වැටුප් පරිමාණයේ අනුරූපි වැටුප් පියවර යන දෙකින් අඩු වැටුප ගෙවීම. (අනුරූපී වැටුප් පියවර යනුවෙන් අදහස් කරන්නේ විශ්‍රාම ලබන අවස්ථාවේ දැරූ තනතුරට අදල වූ වැටුප් පරිමාණයේ උපයාගෙන තිබූ වැටුප් වර්ධක සංඛ්‍යාවට අනුරූපි වන නැවත සේවයේ යොදවා ඇති තනතුරට අදල වැටුප් පරිමාණයේ වැටුප් වර්ධක සංඛ්‍යාව අනුව වැටුප් පියවරය)

(IV) වැටුප් පරිමාණයක් නිශ්චය කර නොමැති තනතුරක නැවත සේවයේ යොදවනු ලබන විටෙක, එකී තනතුරට අදල ප්‍රධාන කාර්යභාරයන් සහ වගකීම් සැලකිල්ලට ගනිමින් සාකච්ඡා/ සම්මුති වැටුපක් ගෙවීම (මෙම වැටුප මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව තීරණය කළ යුතුය.)

(V) අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙර විශ්‍රාම ගොස් නැවත සේවයේ යොදවනු ලබන පුද්ගලයන්ගේ විශ්‍රාම වැටුප, ඔහු අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දිනය හෝ නැවත සේවයේ යෙදවීමේ කොන්ත්‍රාත්තුව අවසන් වන දිනය යන දින දෙකින් පළමුව එළඹෙන දිනය දක්වා පමණක් අවුරා තැබීම.

(VI) විශ්‍රාමික රජයේ නිලධාරියෙකු නැවත සේවයේ යෙදවීම එක් වරකට කොන්ත්‍රාත් පදනම මත මාස දෙළහක (12) උපරිම කාලයකට සීමා කිරීම.

02. විශ්‍රාම ගිය රජයේ නිලධාරියෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවිය යුත්තේ අත්‍යවශ්‍යම අවස්ථාවලදී පමණකි.

03. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා "අවසන් වරට ලද වැටුප" යනුවෙන් අදහස් කරන්නේ නිලධාරියා විශ්‍රාම ලබන අවස්ථාවේ ලබමින් සිටි වැටුප වේ. එයට අවසාන වැටුප් වර්ධක දිනයේ සිට විශ්‍රාම යන දිනය දක්වා වන වැටුප් වර්ධකයේ උපයාගත් කොටස ඇතුලත් නොවේ.

04. නිලධාරියෙකු විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබමින් සිටි වැටුප් පරිමාණය ප්‍රතිශෝධනය වී තිබේ නම් ඔහු නැවත සේවයේ යොදවන විටකදී අදාල කරගත යුත්තේ සංශෝධිත වැටුප් පරිමාණයේ අනුරූපී වැටුප් පියවර වේ.

05. නැවත සේවයේ යොදවන ලද විශ්‍රාමිකයෙකුට වැටුප් වර්ධක හිමි නොවේ.

06. 2000.09.07 දිනැති 15/2000 සහ 2001.10.16 දිනැති 24/2001 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ අතුරු දීමනා හිමි තනතුරක නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමික නිලධාරියෙකුට විශ්‍රාම වැටුප සමඟ ලැබෙන අතුරු දීමනාව අඩුකර වෙනස පමණක් ගෙවිය හැකිය. කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවන නිලධාරීන් සඳහා ගෙවනු ලබන්නේ සියළු දීමනා ඇතුලත් වැටුපක් හෙයින් ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකය තුල අන්තර් දීමනාවේ අදාල කොටස ද ඇතුලත් විය යුතුය.

07. විශ්‍රාම ගැනීමෙන් අනතුරුව දැනටමත් රාජ්‍ය සේවයේ විවිධ තනතුරුවල නැවත සේවයේ යොදවා ඇති සියලුම නිලධාරීන් සම්බන්ධයෙන් මෙම විධිවිධාන මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට අදාළ වේ. 2001.07.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2001 විධිවිධාන අනුව විශ්‍රාම වැටුප අවුරා තැබීම සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප ආවරණය වන සේ ඉහළ වැටුපක්/දීමනාවක් අනුමතකරවා ගෙන දැනට සේවයේ නියුක්තව සිටින නිලධාරීන් වෙනුවෙන් ගෙවන පාරිශ්‍රමිකය ද මේ අනුව සංශෝධනය විය යුතුය.

08. ඉහත විධිවිධාන 2002.11.20 දින සිට බල පැවැත්වේ.

ඩිටා විමලසිරි
ලේකම්,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය